# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 519/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 23/03/2024 පැය 0935

**මාධ්‍ය නිවේදනය**

**109 ක්ෂණික දුරකතන අංකයට ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව - ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය.**

ළමුන්ට හා කාන්තාවන්ට සිදුවන හිංසන සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන විශේෂිත ඒකකයක් ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය තුළ 2024.01.04 වන දින සිට ස්ථාපිත කරන ලදි.

මෙහිදී cwb.online@police.gov.lk දරණ විද්‍යුත් ලිපිනය හරහා සහ ක්ෂණික ඇමතුම් අංක 109 හා 011- 2444444 මඟින් මහජනතාවට ඉතා පහසුවෙන් හා සෘජුවම පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලද අතර ළමුන්ට හා කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ හා එම අපරාධ නිවාරණය සිදු කිරීම හා ළමුන්ට හා කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලිංගික හිංසන හෝ වෙනත් ඕනෑම ආකාරයේ හිංසනයන්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ළමුන් අනාරක්ෂිත වීම, ළමා මෙහෙකාර සේවය හා කෲරත්වයට පත් කිරීම, අන්තර්ජාලය හරහා සිදුවන අපරාධ සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

ඒ අනුව 2024.01.04 වන දින සිට 2024.03.10 වන දින දක්වා 109 ක්ෂණික දුරකථන අංකය ඔස්සේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යංශය වෙත පැමිණිලි 1077 ක් වාර්තා වී ඇත. ඉන් පැමිණිලි 477 ක් විමර්ශන අවසන් කර ඇති අතර, පැමිණිලි 42 ක් සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. පැමිණිලි 08 ක් සමථ මණ්ඩලය වෙත යොමු කර ඇති අතර පැමිණිලි 550 කට අදාලව විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

පොලිස් ස්ථාන වෙත ගොස් පැමිණිලි කිරීමට නොහැකි, නව යොවුන් වියේ දරුවන් හට රහස්‍ය භාවය ආරක්ෂා වන පරිදි ඉහත විද්‍යුත් ලිපිනය හා ක්ෂණික ඇමතුම් අංකය හරහා පැමිණිලි ඉදිරිපත් කිරීමට ද අවස්ථාව සලසා දී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**